# සිංහල ජාතික පුවත්පත්වල භාවිත භාෂාවේ දෝෂ පිළිබඳ අධ්‍යයනයක් - වාර්තා සටහන් ඇසුරින්

**අනුරින් ඉන්දිකා දිවාකර[1], පී. ඒ. දිල්මිණි කුමාරි පෙරේරා[2]**

සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂාව වුව ද වර්තමාන භාවිතයේ දී බොහෝ ක්ෂේත්‍රවල ගැටලු සහගත තත්ත්වයක් පැන නැගී ඇති බව පෙනේ. ඊට මුල්වන ප්‍රධාන හේතුව නම් භාෂාව පිළිබඳ ව අවබෝධය මෙන් ම එය නිසි පරිදි භාවිත කිරීම පිළිබඳව අවබෝධයක් බොහෝ දෙනෙකුට නොමැති වීමයි.

රටක සෑම පුරවැසියකුම තොරතුරු දැන ගැනීමට හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන මාධ්‍යය ජනමාධ්‍යය යි. මෙම අධ්‍යයනය සඳහා පාදක කරගනු ලැබුයේ බහුතර ජන කොටසක් පරිහරණය කරන දිවයින, දිනමිණ, ලංකාදීප හා ලක්බිම යන ජාතික පුවත්පත් ය. පුවත්පත් කිහිපයක් යොදාගනු ලැබුයේ තුලනාත්මක අධ්‍යයනයක් සඳහා වන අතර වාර්තා සටහන් පමණක් තෝරාගනු ලැබුයේ අධ්‍යයනය ගැඹුරින් සේ ම විධිමත් ව සිදු කිරීම සඳහා ය.

පුවත්පත් වාර්තා වැඩසටහන්වලින් හඳුනාගත හැකි භාෂා දෝෂ ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

1. සිංහල භාෂාව හා සම්බන්ධ ගැටලු
   - ව්‍යාකරණ දෝෂ
   - වාක්කෝෂීය දෝෂ
2. වාග්විද්‍යාත්මක ගැටලු
   - ශබ්ද, පදිම, වාක්‍ය, අර්ථ, ප්‍රකරණ
   - විචාරාත්මක දෝෂ
   - ද්විරූපතාව

[1] සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: idiwakara@gmail.com

[2] සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: sundil_2004@yahoo.com

සිංහල භාෂාව හා සම්බන්ධ ගැටලු නිර්ණය කිරීමේ දී ව්‍යාකරණ දෝෂ යටතේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, නිරවුල් ව නිදහස් ව අදහස් ප්‍රකාශ කිරීමේ නොහැකියාව භාෂා අලංකාර ආදී දෝෂ ප්‍රධාන වේ. වාක්කෝෂීය ගැටලු යටතේ අක්ෂර වින්‍යාස දෝෂ, පද සමාස කිරීම් හා නිවැරදි වචන භාවිතය පිළිබඳ ව හඳුනාගත හැකි වන්නේ ගැටලු සහගත බවකි. වාග්විද්‍යාත්මකව විමසීමේ දී පූර්වෝක්ත අංශ පිළිබඳ ව අවධානය යොමු විය.

මෙහි ප්‍රතිඵල නම් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ භාවිත භාෂාවේ දුර්වලතා ඇතිවීම, පුවත්පත් පරිහරණය කරන පුද්ගලයන් තුළ නිදහස්, නිරවුල් අදහස් ගොඩ නොනැඟීම හා එමගින් ඉදිරිපත් වන කරුණු මත ආවේගශීලී, ප්‍රචණ්ඩශීලී හා හැඟීම්බර සමාජ කණ්ඩායමක් බිහිවීම, විවිධ ක්ෂේත්‍ර නියෝජන කරන පුද්ගලයන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැඳී සිටින්නන් භාවිත භාෂාවේ දෝෂ ඇතිවීමයි.

**ප්‍රමුඛ පදඃ** සිංහල භාෂාව, ජාතික පුවත්පත්, වාර්තා වැඩසටහන්, ජනමාධ්‍යය, වාග්විද්‍යාව

**Title:** A study of the error of the Sinhala Language used in national newspapers

**Keywords:** Sinhala language, national newspapers, documentary programmes, mass media, linguistics